# ගම්පහ දිසා අධිකරණයේදීය.

මෙස්ත්‍රි ටිල්වින් සිල්වා
ප්‍රධාන ලේඛම්,
ජනතා විමුක්ති පෙරමුණ,
අංක. 464/20,
පන්නිපිටිය පාර, පැලවත්ත,
බත්තරමුල්ල.

<u>පැමිණිලිකරු</u>

නඩු අංකය :

ස්වභාවය : ඉඩම්

වටිනාකම : රුපියල් මිලියන 20

කාර්ය පටිපාටිය : සාමාන්‍ය

- එදිරිව -

1. කොස්වත්තගේ චමීර නිරෝෂක පෙරේරා,
2. කුමාර් ගුණරත්නම්,
3. සුජීත් කුරුවිට,
4. වින්සන්ට් අප්පුහාමි,
5. ඉන්ද්‍රාණි සෝමලතා,
6. නයනා රංගනී,
7. විශ්වජිත් රණසිංහ,
8. ඉසුරු මලින්ත,
9. සිතිජ කෞශල්‍ය,
10. වැපිටියේ සුගතානන්ද හිමි,
11. දුමින්ද නාගමුව,
12. දේවින්ද කෝදාගොඩ,
13. වසන්ත කරුණාතිලක,
14. අමිල සදරුවන්,
15. ඩී.ජී.යූ.එන්.කේ. ජයරත්න,
16. කේ.එන්.පී. නිසංසලා ප්‍රනාන්දු,
17. ජගත් ප්‍රියදර්ශන,
18. ආර්.ජේ.එම්.පී.ජී.වයි.බී. ජයසේකර,

19. එල්.වී.කේ. කොමාමුල්ල,
20. කේ.එන්.පී. ප්‍රනාන්දු,
1 සිට 20 දක්වා විත්තිකරුවන්
සියල්ලෝම, නො. 49/53/බී,
සල්මල් උයන, කිරිදිවැල පාර,
යක්කල.

සහ අංක. 22/1, මෙල්ඩර් පෙදෙස,
නුගේගොඩ.

<u>විත්තිකරුවන්</u>

වර්ෂ 2026 ක් වූ ජූලි මස   වන දින දී ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු කටයුතු ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරුන් වන **“නීතික පාර්ට්නර්ස්”** යන නාමය විලාශය සහ අභිධානය යටතේ නීතිඥ වෘත්තියේ යෙදී සිටින නීතිඥ නීතිඥවරියන් වන චමීර හපුතන්ත්‍රී, තනුජ් සඳරුවන් සහ නිකිණි මාපිටිගම යන නීතිඥවරුන් මගින් පෙනී සිටින ඉහත නම් සඳහන් <u>පැමිණිලිකරු</u> සිය <u>පැමිණිල්ලෙන්</u> මෙසේ ප්‍රකාශ කර සිටී

01. මෙම නඩුවට විෂයගත මෙහි පහත උපලේඛනගත දේපල පිහිටා ඇත්තේ ද, මෙහි පහත විස්තර කරනු ලබන නඩු නිමිත්ත උපචය වූයේ ද, මෙම ගරු අධිකරණයේ ප්‍රාදේශීය අධිකරණ බල සීමාව තුළ බැවින් මෙම නඩුව අසා නිම කිරීමට මෙම ගරු අධිකරණයට අධිකරණ බලය ඇති බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

02. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මෙම පැමිණිලිකරු එවකට මෙන්ම මේ වන විට ද **“ජනතා විමුක්ති පෙරමුණ”** (ජ.වි.පෙ.) නමැති දේශපාලන පක්ෂයේ ලේකම් ධුරය දරමින් ව්‍යවස්ථාව ප්‍රකාරව පක්ෂ

දේපල දරන තැනැත්තා වන බැවින් පක්ෂය වෙනුවෙන් මෙම නඩුව පැවරීමට බලය ලත් බවයි.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ ව්‍යවස්ථාවෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග **"පැ1"** වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

03. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, මෙහි පහත උපලේඛනගත දේපලෙහි නීත්‍යානුකූල හිමිකරු, පැමිණිල්ලට "පැ9" වශයෙන් අමුණා ඉදිරිපත් කර ඇති ඔප්පුව ප්‍රකාරව **"ජනතා විමුක්ති පෙරමුණ"** (ජ.වි.පෙ.) නමැති දේශපාලන පක්ෂයේ ප්‍රධාන ලේඛම් වන පැමිණිලිකරු වන බවයි.

04. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, මෙරට ලියාපදිංචි දේශපාලන පක්ෂයක් වන **"ජනතා විමුක්ති පෙරමුණ"** (ජ.වි.පෙ.) විසින් වර්ෂ 2005 දී හෝ ඊට ආසන්න කාලයේ දී ගම්පහ ප්‍රදේශයේ පක්ෂ කටයුතු සඳහා ස්ථිර පරිශ්‍රයක් **"ගම්පහ අපේ නිවහන"** නමින් පක්ෂ කාර්යාලයක් පිහිටුවීමේ අවශ්‍යතාවය මත මෙහි පහත උපලේඛනගත දේපල මිලයට ගැනීමට තීරණය කරන ලද බවයි.

05. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ජනතා විමුක්ති පෙරමුණ සංස්ථාගත නොකරන ලද දේශපාලන පක්ෂයක් වන හෙයින් සහ පක්ෂයේ ව්‍යවස්ථාව ප්‍රකාරව පක්ෂයට අයත් නිශ්චල දේපල පක්ෂය වෙනුවෙන් නාමිකයෙකු (nominee) මගින් භාරව දරනු ලබන හෙයින්, එවකට පක්ෂයේ විශ්වාසවන්ත සාමාජිකයෙකු/නිලධාරියෙකු වූ සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න යන අය එම දේපල පක්ෂය වෙනුවෙන් භාරයක් (trust) ලෙස දරා ගැනීම සඳහා එකී දේපල ඔහුගේ නමින් මිලයට ගැනීමට පක්ෂය විසින් සැලැස්වූ බවත්ය.

06. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඒ අනුව, මෙහි පහත උපලේඛනගත දේපල ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඒ. මධුරංගිකා කොස්වත්ත මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක. 03 සහ වර්ෂ 2005.09.30 දිනැති ඔප්පුව

ප්‍රකාරව චන්ද්‍රරත්න සිරිවර්ධන නැමැත්තාගෙන් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ කුසුම් ආසිරි තිලකරත්න නමින් රුපියල් අට ලක්ෂයක (රු. 800,000/-) මුදලකට මිලයට ගන්නා ලද බවත්, එහෙත් එකී මිලදී ගැනීම සඳහා වූ මුළු ප්‍රතිෂ්ඨා මුදලම ජනතා විමුක්ති පෙරමුණේ අරමුදල්වලින් ගෙවන ලද බවත්, එම මිලදී ගැනීම සඳහා සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ කුසුම් ආසිරි තිලකරත්න විසින් කිසිදු මුදලක් වැය නොකළ බවත්, ඒ අනුව එකී ඔප්පුවෙහි නාමික ලැබුම්කරු වශයෙන් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ කුසුම් ආසිරි තිලකරත්න සඳහන් වුවද, ඔහු එකී දේපල මුල සිටම පක්ෂය වෙනුවෙන් භාරයක් ලෙස පමණක් දරා ගත් බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඒ. මධුරංගිකා කොස්වත්ත මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක. 03 සහ වර්ෂ 2005.09.30 දිනැති ඔප්පුවෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග* ***"<u>පැ2</u>"*** *වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

07. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, එකී "**<u>පැ2</u>**" දරන ඔප්පුව ලියා සහතික කළ දින පටන්ම මෙහි පහත උපලේඛනගත දේපලෙහි භුක්තිය ජනතා විමුක්ති පෙරමුණ විසින් ලබාගෙන, එය පක්ෂ කටයුතු සඳහා භාවිත කරමින් හා සංවර්ධනය කරමින් අඛණ්ඩව, නිරවුල්ව සහ නිර්භාධිතව අන් සියල්ලන්ගේ අයිතිවාසිකම් වලට විරුද්ධව භුක්ති විඳිමින් ඊට කාලාවරෝධී අයිතිවාසිකම් ද අත් කර ගෙන ඇති බවයි.

08. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, වර්ෂ 2005 සිට වර්ෂ 2011 දක්වා කාලය තුළ පක්ෂය විසින් "ගම්පහ අපේ නිවහන" යන මැයෙන් සිය සාමාජිකයින්ගෙන් සහ හිතවතුන්ගෙන් අරමුදල් එකතු කරමින්, එකී අරමුදල්වලින් මෙහි පහත උපලේඛනගත දේපල තුළ ගොඩනැගිල්ලක් ඉදිකොට අවශ්‍ය සියලු වැඩිදියුණු කිරීම් සිදු කරන ලද බවත්, එම මිලදී ගැනීම සහ වැඩිදියුණු කිරීම් සඳහා වූ සියලු වියදම් පක්ෂයේ අරමුදල් වලින් දරන ලද බවත්ය.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා* ***"ගම්පහ අපේ නිවහන"*** *ව්‍යාපෘතියට අදාළ අරමුදල් එකතු කිරීමේ සහ වියදම් පිළිබඳ ලේඛන ගොනුව මේ සමග* ***"<u>පැ3</u>"*** *වශයෙන් ද, එහි අඩංගු ගොඩනැගිල්ලේ සැලැස්ම/පිඹුර* ***"<u>පැ3(අ)</u>"*** *වශයෙන් ද,*

*අරමුදල් එකතු කිරීමේ ලේඛන "<u>පැ3(ආ)</u>" වශයෙන් ද, ද්‍රව්‍ය/දෘඩාංග මිලදී ගැනීමේ රිසිට්පත් ගොනුව "<u>පැ3(ඇ)</u>" වශයෙන් ද සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

09. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, උක්ත කරුණු තහවුරු කරමින්, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න යන අය විසින් මෙහි පහත උපලේඛනගත දේපල තමා සතු පෞද්ගලික දේපලක් නොවන බවත්, එය ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් භාරයක් ලෙස පමණක් තමා දරා සිටින බවත් පිළිගනිමින් ඔහුගේ අත්අකුරින් ලියන ලද ලිපියක් පක්ෂය වෙත ලබා දුන් බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න විසින් ලබා දුන් වර්ෂ ලිපියෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග "<u>පැ4</u>" වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

10. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත සම්බන්ධතාවය වසර ගණනාවක් කිසිදු ආරවුලකින් තොරව පැවති අතර, එකී කාලය පුරාම මෙහි පහත උපලේඛනගත දේපල පක්ෂය විසින්ම නිරවුල්ව භුක්ති විඳිමින් පවත්වාගෙන ගිය බවත්, එහෙත් වර්ෂ 2011 දී පක්ෂයේ සාමාජික පිරිසක් ජනතා විමුක්ති පෙරමුණෙන් වෙන්ව ගොස් පෙරටුගාමී සමාජවාදී පක්ෂය (පෙ.ස.ප.) පිහිටුවා ගත් අවස්ථාවේ දී, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න ද එම පිරිස සමග එක්ව ජනතා විමුක්ති පෙරමුණෙන් ඉවත් වූ බවත්ය.

11. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, එසේ පක්ෂයෙන් ඉවත් වූ පසු, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න සහ ඔහු හා එක් වූ පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ පිරිස, ඉහත කී භාරය ප්‍රතික්ෂේප කරමින්, මෙහි පහත උපලේඛනගත දේපල එකී සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්නගේ පෞද්ගලික දේපලක් ලෙස සලකා එතැන් පටන් වරින් වර භාවිත කරමින් සිටි බවත්, එකී දේපල පක්ෂය වෙත නැවත භාර දෙන ලෙස පක්ෂය විසින් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්නගෙන් අවස්ථා ගණනාවක දී

වාචිකව ඉල්ලීම් කළ ද, ඔහු එයට අනුකූල නොවී එකී දේපල පක්ෂය වෙත භාර දීම ප්‍රතික්ෂේප කළ බවත්ය.

12. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, එකී වාචික ඉල්ලීම්වලට සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න අනුකූල නොවූ හෙයින්, පක්ෂය විසින් සිය නීතිඥ රන්ජිත් හේරත් මහතා මගින්, මෙහි පහත උපලේඛනගත දේපල පක්ෂය වෙත නැවත භාර දෙන ලෙස ඉල්ලා වර්ෂ 2017.09.27 දිනැති ලිඛිත දැනුම්දීමක් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න වෙත යවන ලද බවත්, එහෙත් ඔහු එයට ද කිසිදු ප්‍රතිචාරයක් නොදැක්වූ බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා නීතිඥ රන්ජිත් හේරත් මහතා මගින් යවන ලද වර්ෂ 2017.09.27 දිනැති දැනුම්දීමේ ලිපියෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග* ***"*****<u>පැ5</u>*****"*** *වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

13. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, කරුණු එසේ තිබියදී, මෙහි පහත උපලේඛනගත දේපල ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න විසින් භාරයක් ලෙස දරනු ලබන බවට තීන්දු කරවා ගැනීම සහ එකී දේපල පක්ෂය වෙනුවෙන් මෙම පැමිණිලිකරු වෙත පවරා දෙන ලෙසට නියෝග කරවා ගැනීම ඇතුළු වෙනත් සහන අයදිමින්, මෙම පැමිණිලිකරු විසින් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්නට එරෙහිව වර්ෂ 2018 ජනවාරි මස 23 වන දින මෙම ගරු අධිකරණයේ අංක. 3445/L දරන නඩුව පවරන ලද බවයි.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා ගම්පහ දිසා අධිකරණයේ අංක. 3445/L දරන නඩුවේ සම්පූර්ණ නඩු වාර්තාවෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග* ***"*****<u>පැ6</u>*****"*** *වශයෙන් ද, එහි අඩංගු පැමිණිල්ල* ***"<u>පැ6(අ)</u>"*** *වශයෙන් ද සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

14. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, ඉහත අංක. 3445/L දරන නඩුවේ විත්තිකරු වූ සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න වෙත එකී නඩුවේ නියමිත පරිදි සිතාසි භාර දෙන ලදුව ඔහු විසින් එකී නඩුවට ඉදිරිපත් නොවීම මත ඔහුට එරෙහිව ඒක පාර්ශවික

විභාගයට නියම වීමෙන් පසුව, එකී ඒක පාර්ශ්විකව නඩුව විභාග කර ගරු අධිකරණය විසින් ප්‍රකාශයට පත් කරන ලද වර්ෂ 2022.02.28 දිනැති තීන්දුව ප්‍රකාරව මෙහි පහත උපලේඛනගත දේපල ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් භාරයක් ලෙස දරනු ලබන බවට තීරණය කර, එකී දේපල මෙම පැමිණිලිකරු වෙත පවරා දෙන ලෙස සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්නට නියෝග කරන ලද බවත්, ඒ අනුව තීන්දු ප්‍රකාශය (decree) ද ඇතුළත් කරන ලද බවත්ය.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා ඉහත **"<u>පැ6</u>"** දරන නඩු වාර්තාවේ අන්තර්ගත වර්ෂ 2022.02.28 දිනැති තීන්දුවෙහි සත්‍ය ජායා පිටපතක් **"<u>පැ6(ආ)</u>"** වශයෙන් ද,* තීන්දු ප්‍රකාශයෙහි සත්‍ය ජායා පිටපතක් **"<u>පැ6(ඇ)</u>"** වශයෙන් ද *ලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

15. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, කරුණු එසේ තිබිය දී, ඉහත නම් සඳහන් 01 වන විත්තිකරු වන කොස්වත්තගේ චමීර නිරෝෂක පෙරේරා යන අය විසින් මෙම ගරු අධිකරණයේ විභාග වන ලද අංක. 3445/L දරන නඩුවට සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 839 වගන්තිය සමග කියවිය යුතු 328 වගන්තිය ප්‍රකාරව උද්දේශිත ඉල්ලීමක් වර්ෂ 2023.01.02 දිනැතිව ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව ගරු අධිකරණය විසින් එකී නඩුවේ වර්ෂ 2025.06.13 දිනැති නියෝගය ප්‍රකාරව 01 වන විත්තිකරුගේ එකී උද්දේශිත ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලද බවයි.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා ඉහත **"<u>පැ6</u>"** දරන නඩු වාර්තාවේ අන්තර්ගත ඉහත නම් සඳහන් 01 වන විත්තිකරු වන කොස්වත්තගේ චමීර නිරෝෂක පෙරේරා යන අය විසින් මෙම ගරු අධිකරණයේ විභාග වන ලද අංක.* 3445/L *දරන නඩුවට සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 839 වගන්තිය සමග කියවිය යුතු 328 වගන්තිය ප්‍රකාරව වර්ෂ 2023.01.02 දිනැති ඊනියා පෙත්සමෙහි සත්‍ය ජායා පිටපතක් **"<u>පැ7</u>"** වශයෙන් ද, වර්ෂ 2025.06.13 දිනැති නියෝගයෙහි සත්‍ය ජායා පිටපතක් **"<u>පැ8</u>"** වශයෙන් ද සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

16. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉහත අංක. 3445/L දරන නඩුවේ තීන්දුවෙන් සහ තීන්දු ප්‍රකාශය ඉහත නම් සඳහන් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න යන අයට භාර දීමෙන් පසුව, පැමිණිලිකරු සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, එකී සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න විසින් මෙහි පහත උපලේඛනගත දේපල ප්‍රසිද්ධ නොතාරිස් රන්ජිත් කේ. හේරත් මහතා විසින් ලියා සහතික කරන ලද අංක. 257 සහ වර්ෂ 2025.08.22 දිනැති ඔප්පුව ප්‍රකාරව රුපියල් එක් කෝටි අනූ පන් ලක්ෂ හැත්තෑ දහසක (රු. 19,570,000/-) ප්‍රතිෂ්ඨාවකට මෙම පැමිණිලිකරු වෙත පවරන ලද බවත්, එකී ඔප්පුව වර්ෂ 2025.09.18 දින ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ B 79 1/158 දරන පත් ඉරුවෙහි ලියාපදිංචි කරන ලද බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරු එකී දේපලෙහි නීත්‍යානුකූල හා ලියාපදිංචි අයිතිකරු බවට පත් වූ බවත්ය.

*(එකී කරුණු සනාථ කිරීම සඳහා ප්‍රසිද්ධ නොතාරිස් රන්ජිත් කේ. හේරත් මහතා විසින් ලියා සහතික කරන ලද අංක. 257 සහ වර්ෂ 2025.08.22 දිනැති ඔප්පුවෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග **"**<u>පැ9</u>**"** වශයෙන් ද, එකී ඔප්පුව ලියාපදිංචි වී ඇති B 79 1/158 දරන පත් ඉරුවෙහි සත්‍ය ජායා පිටපතක් **"**<u>පැ10</u>**"** වශයෙන් ද සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

17. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, ඉන් අනතුරුව, ඉහත නම් සඳහන් සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න විසින් මෙහි පහත උපලේඛනගත දේපලෙහි භුක්තිය භාර ගන්නා ලෙස පැමිණිලිකරු වෙත දැනුම් දුන් බැවින්, එකී නීත්‍යානුකූල හා ලියාපදිංචි අයිතිය මත මෙම පැමිණිලිකරු, ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන්, වර්ෂ 2025.09.02 දින හෝ ඊට ආසන්න දිනක මෙහි පහත උපලේඛනගත දේපලෙහි භුක්තියට පත් වූ බවත්, එහෙත් එම අවස්ථාවේ දී 1 සිට 20 වන විත්තිකරුවන් (මෙහි මින් මතු ඇතැම් තැනක "විත්තිකරුවන්" වශයෙන් හඳුන්වනු ලබන) විසින් ඊට බාධා කරමින් ආරවුලක් ඇති කර ගත් බැවින්, ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී නේවින් ධර්මප්‍රිය

විජේසිංහ මහතා විසින් එම සිද්ධිය යක්කල පොලිස් ස්ථානයට දන්වා පොලිස් තොරතුරු සටහන් පොතෙහි සටහන් කරවන ලද බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා යක්කල පොලිස් ස්ථානයේ විවිධ පැමිණිලි තොරතුරු පොත අංක i හි වර්ෂ 2025.09.02 දිනැති, 136 වන පිටුවේ, අංක 13 දරන සටහනෙහි සහතික කළ පිටපතක් මේ සමග "<u>පැ11</u>" වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

18. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, කරුණු එසේ තිබිය දී, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න හා දේශපාලනික වශයෙන් සම්බන්ධ වූ පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ සාමාජිකයින්/නිලධාරීන් වන ඉහත නම් සඳහන් විත්තිකරුවන් විසින් ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක. 6131/2/25 දරන ප්‍රාථමික නඩු විධාන සංග්‍රහයේ 66 වගන්තිය ප්‍රකාරව මෙම නඩුවට විෂයගත දේපල සම්බන්ධයෙන් ඊනියා නඩුකරයක් වර්ෂ 2025.09.08 දිනැතිව පැමිණිලිකරුට එරෙහිව පවරන ලද අතර එකී ඊනියා ඉල්ලීම ප්‍රකාරව විත්තිකරුවන් විසින් මෙහි පහත උපලේඛනගත දේපල සඳහා කිසිදු ඔප්පුවක් හෝ නීත්‍යානුකූල හිමිකමක් නොමැතිව, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න මාර්ගයෙන් ඊනියා ලෙස පහත උපලේඛනගත දේපල සඳහා භුක්තිය කියා පෑ බවත්ය.

(*එකී කරුණු සනාථ කිරීම සඳහා ගම්පහ මහේස්ත්‍රාත් අධිකරණයේ අංක.* 6131/2/25 *දරන නඩුවේ සම්පූර්ණ නඩු වාර්තාවෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග "<u>පැ12</u>" වශයෙන් ද, එහි අඩංගු විත්තිකරුවන් විසින් ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද ප්‍රාථමික නඩු විධාන සංග්‍රහයේ* 66 *වගන්තිය ප්‍රකාරව වන පෙත්සමෙහි සත්‍ය ජායා පිටපතක් "<u>පැ12(අ)</u>" වශයෙන් ද, මෙම නඩුවේ පැමිණිලිකරු විසින් එකී මහේස්ත්‍රාත් නඩුවට ඉදිරිපත් කරන ලද දිව්රුම් ප්‍රකාශය සහ එහි ඇමුණුම් මේ සමග "<u>පැ13</u>" වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.*)

19. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, පසුව එකී ගරු මහේස්ත්‍රාත් අධිකරණ නඩුවේ ගරු මහේස්ත්‍රාත්තුමිය විසින් ප්‍රකාශයට පත් කරන ලද වර්ෂ 2026.03.30 දිනැති නියෝගය ප්‍රකාරව භුක්තිය පිළිබඳ හබය විත්තිකරුවන්ට වාසිදායක ලෙස තීරණය කර, විත්තිකරුවන් වෙත මෙම නඩුවට විෂයගත දේපලෙහි භුක්තිය යථා තත්ත්වයට පත් කරන ලෙස නියෝග කරන ලද බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරු එකී දිනයේ සිට මෙහි පහත උපලේඛනගත දේපලෙහි භුක්තියෙන් බැහැර කරනු ලැබූ බවත්, එහෙත් එකී නියෝගය අයිතිය (title) පිළිබඳ හබයට කිසිදු හානියක් නොවන පරිදි (without prejudice to title) ප්‍රකාශයට පත් කරන ලද බවත්, අයිතිය/හිමිකම හබය නිසි බලය සහිත සිවිල් අධිකරණයක් ඉදිරියේ විසඳා ගැනීමට පාර්ශවයන්ට අවසර ලබා දෙන ලද බවත්ය.

(*එකී කරුණ සනාථ කිරීම සඳහා ඉහත* **“**<u>*පැ12*</u>**”** *දරන නඩු වාර්තාවට අන්තර්ගත වර්ෂ* 2026.03.30 *දිනැති නියෝගයෙහි සත්‍ය ඡායා පිටපතක්* **“**<u>*පැ14*</u>**”** *වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.*)

20. පැමිණිලිකරු ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරුවන්ට මෙහි පහත උපලේඛනගත දේපල සම්බන්ධයෙන් කිසිදු වලංගු හිමිකමක් නොමැති බවත්, සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න එකී දේපල පක්ෂය වෙනුවෙන් භාරකරුවෙකු ලෙස පමණක් දරා සිටි අතර ඉහත “<u>පැ9</u>” ඔප්පුව මගින් සිය සියලු හිමිකම් මෙම පැමිණිලිකරු වෙත පවරා දී ඇති බැවින් ඔහුට ද එහි කිසිදු ඵලදායී අයිතියක් ඉතිරිව නොමැති බවත්, මෙම නඩුවට විෂයගත දේපල සඳහා ඇති විත්තිකරුවන්ගේ ඊනියා භුක්තිය හුදෙක්ම සපරමාදු හීරළු පතිරැන්නැහැලාගේ ආසිරි තිලකරත්න යන අයගේ අවසරය මත පැවති භුක්තියක් වන බවත්ය.

21. මෙම නඩුවට විෂයගත දේපලට පැමිණිලිකරුගේ නීත්‍යානුකූල අයිතිවාසිකම නොතකා, වන විත්තිකරුවන් වැරදි ලෙස සහ නීති විරෝධී ලෙස මෙහි පහත උපලේඛනගත දේපලෙහි දිගටම රැඳී සිටිමින්, එකී දේපල විවෘතව පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ “ගම්පහ දිස්ත්‍රික්

කාර්යාලය" ලෙස භාවිත කරමින්, පැමිණිලිකරුගේ අයිතිය ප්‍රතික්ෂේප කරමින් පැමිණිලිකරු එහි භුක්තියෙන් බැහැර කර ඇති බවත්, එමගින් එකී දේපල වැරදි ලෙස රඳවාගෙන සිටින බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා මෙහි පහත උපලේඛනගත දේපලෙහි ගොඩනැගිල්ලෙහි සහ එහි විත්තිකරුවන් විසින් ප්‍රදර්ශනය කර ඇති පෙරටුගාමී සමාජවාදී පක්ෂයේ **"ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය"** නාම පුවරුවෙහි වර්තමාන ඡායාරූප කිහිපයක් මේ සමග **"පැ15"** වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

22. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මෑතක දී, එනම් වර්ෂ 2026.07.28 දින, මෙම නඩුවට විෂයගත දේපල සම්බන්ධයෙන් සහ එකී දේපල සම්බන්ධයෙන් විත්තිකරුවන්ගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන්, ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී නේවින් ධර්මප්‍රිය විජේසිංහ මහතා විසින් යක්කල පොලිස් ස්ථානයට පැමිණිල්ලක් ඉදිරිපත් කොට, එය එම පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොතෙහි (C.I.B. II) සටහන් කරවන ලද බවත්ය.

*(එකී කරුණ සනාථ කිරීම සඳහා යක්කල පොලිස් ස්ථානයේ තොරතුරු සටහන් පොතෙහි (C.I.B. II) වර්ෂ 2026.07.28 දිනැති, 57 වන පිටුවේ, අංක 235 දරන සටහනෙහි සත්‍ය ජායා පිටපතක් මේ සමග **"පැ16"** වශයෙන් සලකුණු කොට මෙහිම කොටසක් ලෙසට ආයාචනය කර සිටී.)*

23. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මෙම නඩුවට විෂයගත දේපල සඳහා ඇති පැමිණිලිකරුගේ නීත්‍යානුකූල හිමිකම ඉහත විත්තිකරුවන් පිළිගෙන සහ පිළිදනිමින් සිටිය දී, මෙම ගරු අධිකරණයේ ඉදිරිපත් කර ඇති කරුණු ප්‍රකාරව බැලූ බැල්මටම විත්තිකරුවන් විසින් එක්ව හා එක් සිත්ව වංචනික චේතනාවෙන් කටයුතු කරමින් පැමිණිලිකරුට අයත් දේපළ නීති විරෝධී ලෙසත්, බලහත්කාරී ලෙසත්, අත්පත් කර ගැනීමේ කූට අරමුණින් කටයුතු කර ඇති බවට සක් සුදක් සේ

පැහැදිලි වන බවත්, තවද, විත්තිකරුවන් විසින් මෙම පැමිණිලිකරුගේ සාධාරණ සහ නෛතික අපේක්ෂාවන් උල්ලංඝනය වන අයුරින් කටයුතු කර ඇති බවත්ය.

24. මෙම නඩුව පවතිද්දී ඉහත විත්තිකරුවන් විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන දේපල සම්බන්ධයෙන් බැඳීම් ඇති කරනු ලබන ලේඛණයන් තුන්වන පාර්ශවයන්ගේ වාසියට සකස් කරනු ලැබුවහොත් එමඟින් මෙම පැමිණිලිකරු හට ද, එවැනි තෙවන පාර්ශවයන්ටද සිදු වන අගතීන් වළක්වනු පිණිස ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ විධිවිධානයන් ප්‍රකාරව මෙහි පහත දේපලට අදාළව ලිස්පෙන්ඩනයක් ලියාපදිංචි කිරීමේ සුදුසු නියෝගයක් අත්තනගල්ල, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලබාගැනීමට යුක්තිය ඉටු කිරීම උදෙසා අත්‍යවශ්‍යව ඇති බවට පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

25. එකී කරුණු අනුව පහත කරුණු අරභයා 01 සට 20 විත්තිකරුවන්ට එරෙහිව එක්ව සහ/හෝ වෙන් වෙන්ව නඩු පැවරීමේ නඩු නිමිත්තක් පැමිණිලිකරු වෙත උපචය වී ඇත;

(අ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි නීත්‍යානුකූල හිමිකරු සහ/හෝ භුක්තිකරු ඉහත "<u>පැ9</u>" දරන ඔප්පුව ප්රකාරව, පැමිණිලිකරු බවට තීන්දු කර තීන්දු ප්රකාශ ගත කර ගැනීම සඳහාත්,

(ආ) මෙහි පහත උපලේඛනගත දේපල සම්බන්ධයෙන් 1 සිට 20 වන විත්තිකරුවන්ට කිසිදු අයිතියක් සහ/හෝ හිමිකමක් නීත්‍යානුකූලව හිමි නොවන බවට තීන්දු කර තීන්දු ප්රකාශ ගත කර ගැනීම සඳහාත්,

(ඇ) මෙහි පහත උපලේඛනගත දේපලින් 1 සිට 20 වන විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පානා ඔවුන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් නෙරපා හැර එකී දේපලෙහි භුක්තිය පැමිණිලිකරු වෙත භාර දෙන ලෙසට නියෝග කරවා ගැනීම සඳහාත්,

(ඈ) වර්ෂ 1927 අංක 23 දරණ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත පනතේ විධිවිධාන ප්‍රකාරව මෙහි පහත උපලේඛනගත දේපළට අදාළව

ලිස්පෙන්ඩනයක් ලියාපදිංචි කිරීමට සුදුසු නියෝගයක් අත්තනගල්ල, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නිකුත් කරවා ගැනීම සඳහාත්,

(ඉ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි පවත්නා ස්වරූපය (status quo) වෙනස් වන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලන ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනමක් ලබා ගැනීම සඳහාත්,

(ඊ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි හිමිකම සහ/හෝ භුක්තිය කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව වෙනත් තැනැත්තෙකුට බැහැර කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලමින් ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනමක් ලබා ගැනීම සඳහාත් වේ.

26. පැමිණිලිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, විත්තිකරුවන් විසින් මෙහි පහත උපලේඛනගත දේපලෙහි ස්වභාවය වෙනස් වන පරිදි ඉදිකිරීම් සිදු කිරීමේ දැඩි හා ආසන්න අවදානමක් පවතින බවත්, විත්තිකරුවන් පැමිණිලිකරුව භුක්තියෙන් බැහැර කර ඇති බවත්, මෙම නඩුවට විෂයගත දේපල ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ කාර්යාලය වශයෙන් භාවිත කළ දේපලක් වන බැවින් එහි භුක්තියෙන් දිගටම බැහැර වී සිටීමෙන් මුදලින් පියවිය නොහැකි බලවත් හා අප්‍රතිකර හානියක් පැමිණිලිකරුට සිදුවන බවත්ය.

27. ඉහත කාරණා මත මෙම නඩුව අසා නිම වන තෙක් අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් මගින් සහ එකී අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගය පිළිබඳ විමසීම අසා නිම වන තෙක් මුල් අවස්ථාවේදීම වාරණ නියෝගයක් මගින් මෙහි පහත උපලේඛනගත දේපලෙහි පවත්නා ස්වරූපය (status quo) වෙනස් වන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ

හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලණු නොලැබුවහොත් සහ මෙහි පහත උපලේඛනගත දේපලෙහි හිමිකම සහ/හෝ භුක්තිය කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව වෙනත් තැනැත්තෙකුට බැහැර කිරීමෙන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ නියෝජිතයින්, සේවකයින් ඇතුළු සෑම සියලු තැනැත්තෙකුම වළක්වාලනු නොලැබුවහොත් පැමිණිලිකරු හට නීතියෙහිලා පිරිමැසිය නොහැකි අගතියක් සහ අනර්ථයක් සිදුවන බවත් හා මෙම නඩුව අවසානයේ පැමිණිලිකරුගේ වාසියට යම් නඩු තීන්දුවක් හා තීන්දු ප්‍රකාශයක් වේ නම් එයද නිරර්ථක සහ ඵල රහිත වේ.

28. පැමිණිලිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ, මෙම නඩුවට හබගතව ඇති සිද්ධිමය කරුණු හේතුකොටගෙන ඉහත විලාසම නඩුව ගරු අධිකරණයේ ගොනු කොට අයැද ඇති නිත්‍ය සහ අතුරු සහන ලබාගැනීමේ හිමිකම මෙම පැමිණිලිකරු සතු වන බවත්, අධිකරණමය ක්‍රියාදාමයකින් තොරව හබගත කරුණු විසදාගැනීම සඳහා පැමිණිලිකරු හැකි සෑම උත්සාහයක්ම දරන ලද බවත්, කෙසේ වූවද එකී උත්සාහයන් විත්තිකරුවන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපයන් නිසා අසාර්ථක වන ලද බවයි.

29. මෙම නඩුවේ අයැද ඇති සියලු සහන මෙම නඩුවේදීම අයැද සිටීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 35(1) වගන්තිය යටතේ අවසර ලබා දීම සඳහා කරුණු පැමිණිලිකරු වෙත උපචය වී ඇත.

30. මුද්දර ගාස්තු කාර්ය සඳහා පැමිණිලිකරු මෙම නඩුව රුපියල් මිලියන 20 ට අගය කොට සිටී.

<u>එසේ හෙයින් පැමිණිලිකරු ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ, ඉහත 01 සිට 20 විත්තිකරුවන්ට එරෙහිව එක්ව සහ වෙන් වෙන්ව;</u>

(අ) මෙම නඩුවේ අයැද ඇති සියලු සහන මෙම නඩුවේදීම අයැද සිටීම සඳහා සිවිල් නඩු විධාන සංග්‍රහය පනතේ 35(1) වගන්තිය යටතේ අවසර ලබා දෙන ලෙසත්,

(ආ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි නීත්‍යානුකූල හිමිකරු සහ/හෝ භුක්තිකරු ඉහත "පැ9" දරන ඔප්පුව ප්‍රකාරව, පැමිණිලිකරු බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ කරන ලෙසත්,

(ඇ) මෙහි පහත උපලේඛනගත දේපල සම්බන්ධයෙන් 1 සිට 20 වන විත්තිකරුවන්ට කිසිදු අයිතියක් සහ/හෝ හිමිකමක් නීත්‍යානුකූලව හිමි නොවන බවට තීන්දු කර තීන්දු ප්‍රකාශ ගත කරන ලෙසත්,

(ඈ) මෙහි පහත උපලේඛනගත දේපලින් 1 සිට 20 වන විත්තිකරුවන් සහ/හෝ එකී විත්තිකරුවන් යටතේ හිමිකම් පානා ඔවුන්ගේ සේවකයින් සහ/හෝ නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් නෙරපා හැර එකී දේපලෙහි භුක්තිය පැමිණිලිකරු වෙත භාර දෙන ලෙසට නියෝග කරන ලෙසත්,

(ඉ) වර්ෂ 1927 අංක 23 දරණ ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත පනතේ විධිවිධාන ප්‍රකාරව මෙහි පහත උපලේඛනගත දේපළට අදාළව ලිස්පෙන්ඩනයක් ලියාපදිංචි කිරීමට සුදුසු නියෝගයක් අත්තනගල්ල, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත නිකුත් කරන ලෙසත්,

(ඊ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි පවත්නා ස්වරූපය (status quo) වෙනස් වන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලන ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනමක් දානය කරන ලෙසත්,

(උ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි හිමිකම සහ/හෝ භුක්තිය කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව වෙනත් තැනැත්තෙකුට බැහැර කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලමින් ස්ථිර ඉන්ජන්ක්ෂන් තහනමක් දානය කරන ලෙසත්,

(ඌ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි පවත්නා ස්වරූපය (status quo) වෙනස් වන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් ඉහත නම් සඳහන් සඳහන්

01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලන මෙම නඩුව අසා නිමවෙන තුරු බලපැවැත්වෙන පරිදි අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන ලෙසත්,

(ඵ) මෙහි පහත උපලේඛනගත දේපලෙහි හිමිකම සහ/හෝ භුක්තිය කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව වෙනත් තැනැත්තෙකුට බැහැර කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලන මෙම නඩුව අසා නිමවෙන තුරු බලපැවැත්වෙන පරිදි අතුරු ඉන්ජන්ක්ෂන් තහනම් නියෝගයක් ලබා දෙන ලෙසත්,

(ඒ) ඉහත කාරණා මත මෙම නඩුව අසා නිම වන තෙක් අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් මගින් සහ එකී අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගය පිළිබඳ විමසීම අසා නිම වන තෙක් මුල් අවස්ථාවේදීම වාරණ නියෝගයක් මගින් මෙහි පහත උපලේඛනගත දේපලෙහි පවත්නා ස්වරූපය (status quo) වෙනස් වන ආකාරයේ කවර හෝ ක්‍රියාවක් සිදු කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 විත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලමින් වාරණ ආඥාවක් ලබා දෙන ලෙසත්,

(ඔ) ඉහත කාරණා මත මෙම නඩුව අසා නිම වන තෙක් අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගයක් මගින් සහ එකී අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝගය පිළිබඳ විමසීම අසා නිම වන තෙක් මුල් අවස්ථාවේදීම වාරණ නියෝගයක් මගින් මෙහි පහත උපලේඛනගත දේපලෙහි හිමිකම සහ/හෝ භුක්තිය කෙටිකාලීනව හෝ දීර්ඝකාලීනව වෙනත් තැනැත්තෙකුට බැහැර කිරීමෙන් ඉහත නම් සඳහන් 01 සිට 20 ]ත්තිකරුවන් සහ එකී විත්තිකරුවන් යටතේ හිමිකම්පාන ඔවුන්ගේ සේවකයින්, නියෝජිතයින්, අනු නියෝජිතයින් සහ/හෝ ඒජන්තයින් සහ/හෝ අවසරලාභීන් වළක්වාලමින් වාරණ ආඥාවක් ලබා දෙන ලෙසත්,

(ඕ) නඩු ගාස්තු සහ;

(ක) මෙම ගරු අධිකරණයට මැනවයි හැගෙන වෙනත් සහ වැඩිමනත් සහනයන් දානය කරන ලෙසත් වේ.

පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥ

<u>ඉහත කී උපලේඛනය</u>

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ මැද පත්තුවේ ගම්පහ මහා නගර සභා බල සීමාව තුල ගම්පහ ප්‍රාදේශීය ලේඛම් කොට්ඨාශයට අයත් 251 යක්කල උතුර ග්‍රාම නිලධාරී වසමේ යක්කල යන ගම පිහිටි "දඹුවකැලේ හික්ගහලන්ද" දැනට "දඹුව එසේටෙට්" හෙවත් "දඹුවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී.ඒ.ඩී.ඒ සේනානායක මහතා විසින් වර්ෂ 1990.09.27 දින මැන සාදන ලද අංක 473A දරන පිඹුරෙහි දැක්වෙන ලොට් 81 දරන කැබැල්ලට, උතුරට: ලොට් R6 සහ ලොට් 53 දරන කොටස් ද, නැගෙනහිරට: ලොට් 53 සහ ලොට් 82 දරන කොටස් ද, දකුණට: පාර ද, බස්නාහිරට: ලොට් 80 ද යන මෙකී මායිම් තුල පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම එකක් (ප. 21.1) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම ශුන්‍ය පහ තුන හතරක් (හෙ. 0.0534) පමණ වූ ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ අයිති සියලු දේ ද වේ.

තවද, එකී ඉඩමට යාම් ඊම් සඳහා එකී අංක 473 ඒ දරන පිඹුරේ සඳහන් පාරවල් පාවිච්චි කිරීමේ අයිතිය සහ බලයත් වේ.

*Neethika Partners*

පැමිණිලිකරුගේ ලේඛනගත නීතිඥ

NEETHIKA PARTNERS
Attorney-at-Law / Notaries Public / Registered Agents / Commissioners for Oaths
No. 21, Belmont Street, Colombo 12.
0710209005, 0714449885, 0712660666